# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2424/04 - 2025 පෙබරවාරි මස 17 වැනි සඳුදා - 2025.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය:* 4-3/2/2018/S/66.
*මගේ අංකය* : BER/4/5/3/5.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/ පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 762 ඒ - කළුවාමෝදර උතුර ග්‍රාම නිලධාරී වසමේ, කළුවාමෝදර ගමේ, මහකුඩළුවෙලකුඹුර ඉඩමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 530722හි කලාප අංක 02, පත්‍ර අංක 01 හා 2024.12.24 දිනැති පිඹුරේ කැබලි අංක 01 ලෙස පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0095 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

01. කැබලි අංක 1
ඉඩමේ නම: මහකුඩළුවෙලකුඹුර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: ප්‍රාදේශීය ලේකම් (බේරුවල); ප්‍රමාණය: පර්චස් 3.8.

උතුරට: එන්. කේ. ප්‍රදීප් නිශාන්ත සිල්වා භුක්ති විඳින මහකුඩළුවෙලකුඹුර සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ එන්. කේ. ප්‍රදීප් නිශාන්ත සිල්වා භුක්ති විඳින මහකුඩළුවෙලකුඹුර; දකුණට: එන්. කේ. ප්‍රදීප් නිශාන්ත සිල්වා භුක්ති විඳින මහකුඩළුවෙලකුඹුර; බටහිරට: එන්. කේ. ප්‍රදීප් නිශාන්ත සිල්වා භුක්ති විඳින මහකුඩළුවෙලකුඹුර.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2025 මාර්තු මස 26 වැනි දින පෙ.ව. 10.00 ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2025 මාර්තු මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එල්. යූ. ජානක පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2025 ජනවාරි මස 25 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02-0136

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: KOLDS/LND/05/ACQ/13.

උක්ත ශීර්ෂය යටතේ 1991.12.10 දින මවිසින් අංක 692/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* 12-509 යටතේ පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ දැන්වීමෙහි සඳහන් ඉඩමේ විස්තර පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ඉවත් කළ යුතු තොරතුරු | ආදේශ කළ යුතු තොරතුරු |
|---|---|
| අවසාන ගම් සිතියම් අංක 464 887හි | අවසාන ගම් සිතියම් අංක |
| අතිරේක අංක 4හි කැබලි | අතිරේක අංක 2 පත්‍ර අංක 2 කැබලි 227 |

**එස්. ටී. ප්‍රියංකා වීරසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
කොලොන්න.

2025 ජනවාරි මස 23 වැනි දින,
කොලොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02-0139

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉහල ඌව සංවර්ධන වැඩසටහන අදියර 01 පස්සර පුහුල්වත්ත වැව ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4/3/9/2011/IR/189
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: BD/PS/LND/4/1/6-II.

2013 පෙබරවාරි 07 වැනි දින ප්‍රසිද්ධ කරන ලද අංක 1796/11 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* III වැනි කොටසේ පළකරන ලද 7 වැනි වගන්තිය යටතේ දැන්වීම හා බැඳේ.

එහිදී අතපසුවීමකින් පුවත්පත් දැන්වීම ප්‍රසිද්ධ කර නොමැති බැවින්, 2013.03.28 දින පවත්වන ලද හිමිකම් පරීක්ෂණය අවලංගු කර, 2025/03/21 දින නැවත හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන බැවින්, අංක 01 සිට 25 දක්වා ඉඩම් කැබලි හා ප්‍රමාණයන්ට අදාළ හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2025/03/14 දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එන්. ජේ. ටී. අනුරාධා,**
ප්‍රාදේශීය ලේකම්, (*වැ.බ.*)
පස්සර.

2025 පෙබරවාරි මස 07 වැනි දින,
පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02-0140